153

දුර්ලභ

# සිංහල ළමා පොත පත

ක්‍රිස්තුවර්ෂ 1900 සිට 1990 දක්වා ශ්‍රී ලංකාවේ
ප්‍රකාශිත සිංහල ළමා සාහිත්‍ය කෘති පිළිබඳව
කරන ලද ශාස්ත්‍රීය අධ්‍යයනයකි.

කැළණිය විශ්ව විද්‍යාලයේ
පුස්තකාල විද්‍යාව ශාස්ත්‍රපති උපාධිය සඳහා
ඉදිරිපත් කෙරෙන නිබන්ධනය
1993

| ප්‍රවේශ අංකය | 153 |
| --- | --- |
| වර්ග අංකය | |

ගීතාංජලි සමන් දොළගේ විසිනි.
පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය
කැළණිය විශ්ව විද්‍යාලය
දළුගම.

# හැඳින්වීම

මෙම ශාස්ත්‍රපති උපාධි නිබන්ධනය, ක්‍රිස්තු වර්ෂ 1900 සිට 1990 දක්වා ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත සිංහල ළමා සාහිත්‍ය කෘති පිළිබඳව කරන ලද ශාස්ත්‍රීය අධ්‍යයනයකි. ළමා පද්‍ය - නාට්‍ය සහ ගද්‍ය ප්‍රබන්ධත්, චරිතාපදානත් මෙම නිබන්ධනයේ දී විශේෂ අවධානයට ලක් කර තිබේ.

මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ,

1900 - 1990 දක්වා සිංහල භාෂාවෙන් පළ වූ ළමා පොත පත ඝන ගණයට අයත් කළ හැකි කෘති පැහැදිලි කරගෙන, සිංහල ළමා සාහිත්‍ය ඉතිහාසය පිළිබඳව ගවේෂණය කිරීම ;

ජන සාහිත්‍යය හා විදේශීය ළමා සාහිත්‍යය, සිංහල ළමා සාහිත්‍යය කෙරේ බල පෑ අන්දම පිළිබඳව පරීක්ෂා කිරීම ;

සියලු ළමා පොත් පත් රැස් කළ විශේෂ පුස්තකාලයක් නොමැති හෙයින්, ළමා කවි, නාට්‍ය, ප්‍රබන්ධ, චරිතාපදාන ආදියෙහි එක් පිටපතක් හෝ ලබා ගත හැකි පුස්තකාල කීපයක් අනාවරණය කර ගැනීම ;

සියළුම ළමා සාහිත්‍යය සංරක්ෂණය කර ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කිරීම ;

විවිධ යුගයන්හි ලියැවුණු ළමා පොත පත ගැන තොරතුරු ලබා ගත හැකි ග්‍රන්ථ නාමාවලියක් නොමැති වීමේ අඩුව තරමක් දුරට හෝ සපුරා ලීම ;

සහ,

ළමා පොත් කතුවරුන්ගේ සේවය අගැයීම හා ළමා සාහිත්‍ය ක්ෂෙත්‍රයේ අඩුපාඩු මගහරවා ගැනීමට විශිෂ්ට කෘති බිහි කිරීමට රචකයින් පෙළඹවීම යන මේවාය.